සිය පෙම්වතා බවට පැවසෙන තරුණයෙකු සමඟින් මෙරටට පැමිණි, එක්සත් රාජධානියේ පුරවැසි ශ්‍රී ලාංකික සම්භවයක් සහිත තරුණියක ගල්කිස්සේ මහල් නිවාස සංකීර්ණයකින් වැටී මිය ගොස් සිටියදී සොයා ගෙන ඇති බව මාධ්‍ය වාර්තා කර තිබිණි. මෙය දැනට පරීක්ෂණ පැවැත්වෙමින් තිබෙන අභිරහස් මරණයක් බව පොලීසිය පවසන බවත් මාධ්‍ය ඔස්සේ වැඩිදුරටත් වාර්තා වී තිබිණි.

මෙම සිදුවීම සිංහල භාෂා පුවත්පත් කිහිපයක් ඔස්සේ වාර්තා වී තිබූ ආකාරය පහත පරිදි දැක්විය හැක.

ඔබ සිතන ලෙසට,

1) ලංකාදීප සහ දිනමිණ පුවත් වාර්තාවන්හි දැක්වෙන,මෙම මියගිය තරුණියගේ "සුරූපී" බව හෝ "රූමත්" බව, සැබැවින්ම පුවතට අදාළ ද?

2) දිවයින සහ අද පුවත් වාර්තාවන් මියගිය තරුණියගේ බාහිර රූපය සම්බන්ධයෙන් කිසිවක් ඉස්මතු නොකරමින් පුවත වාර්තා කිරීම, වඩාත් යෝග්‍ය වාර්තාකරණය නොවන්නේද?

3) ලංකාදීප සහ දිනමිණ පුවත් වාර්තාවන්, මෙසේ අදාළ නොවන බාහිර රූපය ඉස්මතු කර දක්වන්නේ, පුවතට අවශ්‍ය නොවන හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබා දීමට ද?